# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

## பொலிஸ் ஊடகப் பிரிவு

## POLICE MEDIA DIVISION

14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය<br>Date | 2025.01.20<br>පැය 1135 | දුරකථන අංකය<br>Tel.NO | 011-2887973 | මගේ අංකය<br>My NO | D/Media/Out/ 100 /2025 | විද්‍යුත් ලිපිනය<br>E-Mails | dir.media@police.gov.lk |

**රගර් තරඟ ජයග්‍රහණයක් - පොලිස් ක්‍රීඩා කොට්ඨාසය.**

ශ්‍රී ලංකා රගර් සම්මේලනය මඟින් සංවිධානය කරනු ලැබූ 2025 අන්තර් ක්‍රීඩා සමාජ ලීග් රගර් තරඟාවලිය 2025.01.10 වන දින වැලිසර නාවික හමුදා ක්‍රීඩා පිටියේදී පැවත්විණි.

එහිදි, ශ්‍රී ලංකා නාවික හමුදා රගර් කණ්ඩායමට එරෙහිව තියුණු තරඟයකින් පසු උත්සාහක දිනුම් 04 ක්, ගෝල් ලකුණු 01 ක් සහ දඬුවම් පහර 02 ක් ලබා මුළු ලකුණු 23 ක් ලබාගෙන ශ්‍රී ලංකා පොලිස් රගර් කණ්ඩායම ජයග්‍රහණය කර ශ්‍රී ලංකා පොලිසියට කීර්තියක් ලබා දී ඇත.

ශ්‍රී ලංකා පොලිස් රගර් කණ්ඩායමේ සභාපති ලෙස ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති රන්මල් කොඩිතුවක්කු මහතා කටයුතු කරන අතර ලේකම් ලෙස ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී ලලිත් ලීලාරත්න ද පුහුණුකරු ලෙස එන්.ඉබ්රහිම්, කණ්ඩායම් නායක ලෙස උප පොලිස් පරීක්ෂක මොහාන් විමලරත්න, කළමණාකරු ලෙස පොලිස් පරීක්ෂක එස්.එම්.එස් සමරකෝන් යන මහත්වරු කටයුතු කරනු ලබයි.

**මෙම අවස්ථාවට අදාල ඡායාරූප කිහිපයක්**




BIC
©Chamara Senarath
ThePapare

BIC
©Chamara Senarath
www.thepapare.com/photos
ThePapare

BIC
©Chamara Senarath
www.thepapare.com/photos
ThePapare







**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**